# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය, සිව්වන වසර (මාර්ගගත) - 2021

## කම්කරු නීතිය

(පැ තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : **06**

ප්‍රශ්න **තුනකට (03)** පමණක් පිළිතුරු සපයන්න.

(නොපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

---

**01. (අ) සහ (ආ)** කොටස් **ද්විත්වයටම** පිළිතුරු සපයන්න.

(අ) Rawanaella Tea Estate Company (RTEC) එහි තේ කර්මාන්තශාලාවේ සේවය කිරීම සඳහා සේවකයන් Quick Service වෙතින් කුලියට ලබා ගනියි. සඳුදා සිට සෙනසුරාදා දක්වා සේවයට වාර්තා කිරීම සේවකයන්ගෙන් අපේක්ෂිතය. Quick Service ඔවුන්ගේ කාර්යාලයේ සිට තේ කර්මාන්තශාලව දක්වා ප්‍රවාහන පහසුකම් සපයනු ලබයි. සියලුම සේවකයන් කර්මාන්තශාලාව වෙත පිටත්වීමට පෙර Quick Service හි කාර්යාලයේ තබා ඇති පැමිණීමේ ලේඛනයේ අත්සන් කළ යුතුය. Quick Service සේවකයන්ට අදාල වැඩ කොටස වෙන් කරන අතර ඔවුන් කර්මාන්තශාලාවේ සිදුකරන කාර්ය අනුව සේවකයන්ගේ වැටුප් තීරණය කරයි. Quick Service විසින් මසකට දෙවතාවක් සේවකයන්ට ගෙවීම් කරනු ලබයි. සේවකයන් සම්බන්ධ විනය පාලනය Quick Service සිදුකරයි. සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායකත්වය නොදීම සම්බන්ධව කොමසාරිස්වරයාට පැමිණිලි කිරීමට සේවකයන් බලාපොරොත්තු වේ. ඔවුන්ගේ සේවායෝජක වන්නේ RTEC ද නැතහොත් Quick Service ද යන්න දැනගැනීමට ඔවුන් අපේක්ෂා කරයි.

සේවකයන්ට උපදෙස් දෙන්න.

(සම්පූර්ණ ලකුණු ප්‍රමාණයෙන් 50% ක් හිමි වේ.)

(ආ) ‘BEST PRODUCTS’ ප්‍රසිද්ධ නිමි ඇඳුම් අපනයන සමාගමකි. සමාගම විවිධ රැකියා ගිවිසුම් යටතේ සේවකයන් සමාගමට සම්බන්ධ කර ගනී. සමාගමෙහි මානව සම්පත් කළමණාකරු විශ්‍රාම යෑමේ වයසට ලඟා විය. ඉන්පසු සමාගම ඔහුව වසර තුනක සේවා ගිවිසුමක් යටතේ සේවයේ යෙදවීය. සමාගම ගණකාධිකාරිවරයකු ස්ථිර සේවකයෙක් ලෙස බඳවාගත් අතර ඔහුට දැනුම් දෙනු ලැබුයේ ඔහු වසරක කාලයක් සතුටුදායක සේවයක් සැපයුවහොත් ඔහුව සේවයේ ස්ථිර කළ හැකි බවය. ඇසුරුම් කිරීමේ අංශයේ සමහර සේවකයන්ට කොරෝනා වෛරසය ආසාදනය වූ අතර ඔවුහු නිරෝධායනය වෙමින් සිටියහ. කළමණාකාරිත්වය, සේවකයන් පස් දෙනෙකුගේ සේවය ඇසුරුම් අංශයට අවශ්‍ය විටදී ලබා ගෙන ඇත. ඔවුන්ගේ ගෙවීම් දෛනිකව ගෙවීය.

ඔබ සමාගමේ නීති නිළධාරිවරයකු ලෙස සේවය කරන්නේ යැයි උපකල්පනය කරන්න. සමාගමෙහි සේවා ගිවිසුම් වර්ග සහ සේවා ගිවිසුම් අවසන් කිරීම සම්බන්ධ නෛතික පැතිකඩයන් පිළිබඳව සමාගමේ කළමණාකරන මණ්ඩලය වෙත පැහැදිලි කරන ලෙස ඔබගෙන් ඉල්ලා ඇත.

නෛතික අධිකාරින් උපුටා දක්වමින් පැහැදිලි කරන්න.

(සම්පූර්ණ ලකුණු ප්‍රමාණයෙන් 50% ක් හිමි වේ.)

**02.** Zigma (Pvt) Ltd නිමි ඇඳුම් අපනයන සමාගමකි. වරුණ, සහන් සහ විමල් ඇතුළුව සේවකයන් 60 දෙනෙක්ව සමාගම සේවයේ යොදවයි. ජාත්‍යන්තර වෙළඳපළෙහි කඩා වැටීම හා ආර්ථික පසුබෑම හේතුවෙන් සමාගම සේවකයන් විශාල සංඛ්‍යාවක් කපා හැරීමට තීරණය කළේය. කාර්මික ආරවුල් පනත යටතේ කම්කරු කොමසාරිස්වරයා ඉදිරියේ ඇතුලත්වූ සමථකරණයෙන් ලැබුණු විසඳුමට අනුව වරුණ ඇතුළු සේවකයන් 20 දෙනෙක්ගේ සේවය අවසන් කරන ලදි. කෙසේ වෙතත්, තමාගේ සේවය අසාධාරණ සහ අසමාන ලෙස අවසන් කළ බව පවසමින් වරුණ කම්කරු විනිශ්චය සභාවක් වෙත ඉල්ලුම්පත්‍රයක් ගොනු කළේය.

Zigma (Pvt) Ltd හි තිබෙන එකම වෘත්තීය සමිතිය, සමාගමේ සේවකයන් ගෙන් 80% කට වඩා වැඩි සාමාජික පිරිසකගෙන් සමන්විත වේ. පෙර සඳහන් කරන ලද සමථකරණය හරහා ඇති කරගත් විසඳුමට අනුගත වීමට පෙර, වෘත්තීය සමිතිය සාමුහික කේවල්කරණය සඳහා සමාගමේ කළමණාකාරිත්වය වෙත ආරාධනා කළේය. නමුත් සමාගමේ කළමණාකාරිත්වය ඉල්ලීම පිළිගැනීම ප්‍රතික්ෂේප කළ අතර කළමණාකාරිත්වය වෘත්තීය සමිතිය නොපිළිගත් බව සඳහන් කළේය.

සමාගම විසින් එකඟ වූ වන්දිය ප්‍රමාණවත් නොවන බැවින් සමථකරණය මඟින් ඇති කරගත් විසඳුම සහන් පිළිනොගත්තේය. එකඟතාවය පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම අකීකරු බවක් යැයි චෝදනා කරමින් සමාගම ඔහුගේ සේවය අවසන් කළේය. සහන් ඔහුගේ සේවය අවසන් කිරීමට විරුද්ධව සහන ලබා ගැනීම සඳහා කම්කරු විනිශ්චය සභාවක් වෙත ඉල්ලුම්පත්‍රයක් ගොනු කළේය. කම්කරු විනිශ්චය සභාව ඉදිරියේ අදාල ඉල්ලුම්පත්‍රය විනිශ්චය වෙමින් පවතින විට, අමාත්‍යවරයා සහන් සහ සමාගම අතර ඇති ආරවුල බේරුම්කරණය හරහා නිරවුල් කර ගැනීමට යොමු කළේය.

විමල් හා සමාගම අතර දීමනාවක් නොගෙවීම සම්බන්ධයෙන් ආරවුලක් විය. අමාත්‍යවරයා විසින් ආරවුල බේරුම්කරණය සඳහා යොමු කළේය. පසුව අමාත්‍යවරයා විසින් ආරවුල බේරුම්කරුගෙන් ඉවත්කර වෙනත් බේරුම්කරුවෙක් වෙත යොමු කළේය.  පාර්ශවයන් අතර පවතින සේවා ගිවිසුමේ වගන්තීන් ගෙන් තමා බැඳී සිටින බව විමර්ශනය අතරතුර බේරුම්කරු සඳහන් කළේය.

විනිශ්චිත නඩු තීන්දු සහ අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඇසුරින් ඉහත සිදුවීමෙහි නෛතික ආනුශංග සාකච්ඡා කරන්න.

**03.** මහේන් යනු ABC මෘදුකාංග සමාගමේ සේවය කළ පනස් අට වියැති මෘදුකාංග සංවර්ධකයෙක් වේ. ඔහු වසර තිහක පමණ සිට සමාගමේ සේවය කර ඇත. වසරකට පමණ පෙර ඵලදායි නොවන ලෙස සේවය කිරීම හේතුවෙන් විධිමත් අනතුරු ඇඟවීමක් ඔහුට ලැබිණි. 2021 අගෝස්තු 20 වන දින රාත්‍රියේ සේවයෙන් පසු නිවසේ සිටින විට ඔහුගේ පුද්ගලික විද්‍යුත් තැපැල වෙත වර්ගවාදී විද්‍යුත් ලිපි දාමයකින් " ඔබ දාමය බිඳ දැමුවහොත් ඔබගේ ජීවිතයේ ඉතිරි කාලයේදී අවාසනාව උදාවේ" යනුවෙන් අවසන්වන වචන සහිත විද්‍යුත් ලිපියක් ඔහුට ලැබුණේය.  ඔහු තමාගේ සම සේවකයකු වන හතලිස් හැවිරිදි සුරේන්ගේ පුද්ගලික විද්‍යුත් ලිපිනය වෙත එම විද්‍යුත් ලිපිය යොමු කළේය. 2014 සැප්තැම්බර් 4 වන දින ABC මෘදුකාංග සමාගම සුරේන්ව සේවයට බඳවා ගත්තේය. 2021 අගොස්තු 21 දින පෙරවරු 9.30 ට පමණ සුරේන් විද්‍යුත් ලිපිය ඉදිරියට යැවීය. ABC මෘදුකාංග සමාගමේ හොඳම සේවාදායකයෙක් වන සෙනරත්ගේ විද්‍යුත් ලිපිනය වෙත වැරදීමකින් එය යොමු විය. මහේන් සහ සුරේන් සෙනරත් සමඟ මෘදුකාංග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක සම්බන්ධ වී සිටින ලදී.

සෙනරත් විසින් මේ පිළිබඳව සමාගමේ කළමනාකාරිත්වය වෙත දැනුම්දුන් පසු සමාගම අභ්‍යන්තර පරීක්ෂණයක් සිදු කළේය. මහේන් සහ සුරේන් ගේ හැසිරීම මඟින් සමාගමේ වෘත්තීමය සම්මත

ප්‍රතිපත්තිය කඩ වී ඇති බවට 2021 අගෝස්තු 22 දින සමාගම නිගමනයකට එළඹියේය. විෂමාචාර හේතුවෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි ඔවුන්ගේ සේවය අවසන් වන බව 2021 අගෝස්තු 23 දින සමාගම ඔවුන් වෙත දැනුම් දුන්නේය. සමාගමේ නම අපකීර්තියට පත් කිරීම හේතුවෙන් සමාගමට සිදුවූ පාඩුව සඳහා ඔවුන්ගේ පාරිතෝෂිතයෙන් රුපියල් 150,000/- ක් කපා ගැනීමට තීරණය කර ඇති බව සමාගම තවදුරටත් ඔවුන් වෙත දැනුම් දුන්නේය. නිසි ගෘහස්ථ පරීක්ෂණයක් පැවැත්වීමෙන් තොරව ඔවුන්ගේ සේවය අවසන් කර ඇති බවට මහේන් සහ සුරේන් චෝදනා කරයි. සමාගමෙහි වෘත්තීමය සම්මත ප්‍රතිපත්තියක් නොමැති බවට ඔවුන් තවදුරටත් දක්වයි.

ඔවුන්ගේ සේවය අවසන් කිරීම සඳහා සහන සහ පාරිතෝෂිත කපා ගැනීම අභියෝගයට ලක් කිරීම සඳහා කම්කරු විනිශ්චය සභාවකට ඉල්ලුම්පත්‍රයක් ගොනු කිරීමට ඔවුන් අපේක්ෂා කරයි.

අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් ඔවුන්ට උපදෙස් දෙන්න.

**04.** (අ) සහ (ආ) කොටස් **<u>ද්විත්වයටම</u>** පිළිතුරු සපයන්න.

(අ) පාරිතෝෂිත ගෙවීම් පිළිබඳ පනත සේවා යෝජකයන් සහ සේවකයන් අතර අයිතීන් තුලනය කිරීමට සමත් වේදැයි යන්න සහ සේවකයන් වෙත සෑහීමකට පත්විය හැකි ආකාරයේ සමාජ ආරක්ෂාවක් සපයන්නේද යන්න සාකච්ඡා කරන්න. අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ විනිශ්චිත නඩු තීන්දු උපුටා දක්වමින් ඔබගේ පිළිතුර සනාථ කරන්න.

(සම්පූර්ණ ලකුණු ප්‍රමාණයෙන් 40% ක් හිමි වේ.)

(ආ) සේවකයන්ගේ සේවය අවසන් කිරීම පිළිබඳ (විශේෂ විධිවිධාන) පනතින් සේවායෝජකයන් සහ සේවකයන් අතර අයිතීන් තුලනය කරන්නේද යන්න, කොවිඩ් 19 වසංගතය හේතුවෙන් රැකියාවන් ආශ්‍රිතව නැගී එන ගැටළු ඇසුරින්, සාකච්ඡා කරන්න. අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ විනිශ්චිත නඩු තීන්දු උපුටා දක්වමින් ඔබගේ පිළිතුර සනාථ කරන්න.

(සම්පූර්ණ ලකුණු ප්‍රමාණයෙන් 60% ක් හිමි වේ.)

**05.** (අ) සහ (ආ) කොටස් **<u>ද්විත්වයටම</u>** පිළිතුරු සපයන්න.

(අ) අදාල සංගමය පිහිටුවා ගන්නා ලද සත්‍ය ක්‍රියාකාරකම් ලුහුබැඳ යාම තහවුරු කර නොමැති නම් සමාගමයේ නිදහස යන්න හුදු පොදු බැඳියාවන් වෙනුවෙන් පුද්ගලයන් එකට එකතු වීම ආරක්ෂා කරන නොගැඹුරු දෙයක් වනු ඇත.

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නෙහිද? වෘත්තීය සමිතිවාදය හා සම්බන්ධ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) සම්මුතීන් සහ වෘත්තීය සමිතිවාදය පාලනය කරන ශ්‍රී ලංකාවේ නීතිය ඇසුරින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න.

(සම්පූර්ණ ලකුණු ප්‍රමාණයෙන් 50% ක් හිමි වේ.)

(ආ) මහජන අයිතීන් සහ සේවායෝජක අයිතීන් පිළිබඳ නිසි සැලකිල්ලෙන් යුතුව, වැඩ වර්ජන ක්‍රියාමාර්ගයකට සම්බන්ධ වීමේ අයිතිය, පරම අයිතියක් ලෙස නොව සාපේක්ෂ අයිතියක් ලෙස භාවිතා කළ යුතුය.

අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීන්දු අධිකාරීන් ඇසුරින් ඉහත ප්‍රකාශය විශ්ලේෂණය කරන්න.

(සම්පූර්ණ ලකුණු ප්‍රමාණයෙන් 50% ක් හිමි වේ.)

**06.** Rock Lanka Ltd වානේ නිෂ්පාදන සමාගමකි. සමාගම වානේ නිෂ්පාදනයන් විවිධ රටවලට අපනයනය කරයි. සමාගම එහි කර්මාන්තශාලාවෙහි, පිරිමි සේවකයන් හතලිස් දෙනෙක් ද කාන්තා සේවිකාවන් දස දෙනෙක් ද සේවයේ යොදවයි. පිරිමි සේවකයන් හතලිස් දෙනා අතරින් පිරිමි සේවකයන් දෙදෙනෙකු වයස අවුරුදු පහළවක් වන අතර වයස අවුරුදු දාහතක් වන තවත් පිරිමි සේවකයන් දෙදෙනෙක් වානේ තීරු කැපීමෙහි නිරත වේ. කාන්තා සේවිකාවන් දසදෙනා හා පිරිමි සේවකයන් පස් දෙනෙකු එකම ස්වභාවයේ කාර්යක නිරත වේ. නමුත් එකම සේවයක නිරතවන කාන්තා සේවිකාවන්ට කරන ගෙවීම් පිරිමි සේවකයන් වෙත කරන ගෙවීමට වඩා අඩු වේ. “සමාගම ඔබට පුහුණුවක් සපයා ඇති බැවින් සේවයට බඳවාගෙන වසර පහක් යනතුරු සමාගමෙන් ඉවත්වීමට අවසර නොලැබේ” යනුවෙන් වගන්තියක් සෑම සේවකයකුගේම සේවා ගිවිසුමෙහි සමන්විත වේ. “සමාගම සමඟ මාගේ සේවා ගිවිසුම පවතින කාලය තුල මම වෘත්තීය සමිතියක් පිහිටු

වීම හෝ සම්බන්ධ වීම නොකරමි" යනුවෙන් ප්‍රකාශනයක් සමාගම සෑම සේවකයෙක්ගෙන්ම මෑතකදී ලබා ගෙන ඇත.

Rock Lanka Ltd වෙතින් භාණ්ඩ ආනයනය කරන විදේශීය සමාගමක්, Rock Lanka Ltd හි කම්කරු පරිචය පිළිබඳව සැලකිලිමත්වී ඇත. Rock Lanka Ltd හි කම්කරු පරිචයන් මඟින් ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) ප්‍රධාන කම්කරු ප්‍රමිතීන් උල්ලංඝනය වීම සහ ශ්‍රී ලංකාවේ කම්කරු ප්‍රමිතීන් උල්ලංගනය වීම පැහැදිලි කරමින් වාර්තාවක් සකස් කරන ලෙස විදේශීය සමාගම ඔබෙන් ඉල්ලා සිටියි.

වාර්තාව සකස් කරන්න.

(සෑම ප්‍රශ්නයක්ම 100 න් ලකුණු කරනු ලැබේ)

************